INTERNATIONAL TRUTH AND JUSTICE PROJECT

**2021 ජනවාරි 8**

W ITJPSL.COM
E ITJPSL@GMAIL.COM

EXECUTIVE DIRECTOR:
YASMIN SOOKA

**මාධ්‍ය නිවේදනය: සල්ලි ගිය අත සොයන්න - ශ්‍රී ලංකාවේ ආයුධ ගනුදෙනුවෙන් යටිමඩි ගසන ලද ඇමරිකානු ඩොලර් 6.143,000 ට මොකද වුනේ?**

**ජොහැන්නස්බර්ග්:** ශ්‍රී ලංකාව මිග් ගුවන් යානා මිලදී ගැනීම සම්බන්ධයෙන් පුවත්පත් කර්තෘ ලසන්ත වික්‍රමතුංග ගවේෂණ ආරම්භ කර 13 අවුරුද්දක් ගතවූ පසුත් එම ගනුදෙනුවේදී  යටිමඩි ගසන ලද බව යුක්රේනියානු නීතිපතිවරයා විසින් පවසන ලද ඇමරිකානු ඩොලර් හැට ලක්ෂයකට වැඩි මුදලට සිදුවූ දෙයක් අද වන තුරුත් දැන ගන්නට නැත. ඒ වෙනුවට සිදුවූයේ මුදල් ගිය පාර සොයාගෙන ගිය ලසන්ත 2009 ජනවාරි 8 දා මහදවාලේ කොළඹ දිස්ත්‍රික්කයේදී ඝාතනය කර දමනු ලැබීමයි. ඒ ගැන නඩු විභාගය 2021 ජූනි දක්වා කල් යාම නිසා කතුවරයාගේ මරණය සම්බන්ධයෙන් යුක්තිය ඉටු වීම පිළිබඳ බලාපොරොත්තු බොඳ වෙමින් පවතී.

මිග් ගනුදෙනුවේ තැරැව්කාර යුක්රේනයේ හිටපු ශ්‍රී ලංකා තානාපති උදයංග වීරතුංගට එරෙහිව ශ්‍රී ලංකා පොලිසිය විසින් පවරන ලද සමාන්තර නඩු විභාගයක් ද ඇණහිට තිබේ. අවුරුදු ගණනක් තිස්සේ නීතියෙන් පලා යමින් සිටි උදයංග ආපසු සියරට බලා ආවේ සිය ඥාති සහෝදර රාජපක්ෂවරුන් බලයට පත්වීමෙන් අනතුරුවය. කොළඹ පැමිණි උදයංග 2020 දී අත් අඩංගුවට ගෙන, ඇප පිට මුදා හැර සිය ඥාති සහෝදර අගමැති  වරයාගේ කාර්යාලයේ සම්බන්ධීකරණ ලේකම් ලෙස පුදුම සහගත අයුරින් පත් කරන ලද බව මාධ්‍ය විසින් වාර්තා කර තිබේ[1].

*“ලසන්ත වික්‍රමතුංග ගේ නිර්භීත වාර්තාකරණය විසින් මතු කරන ලද ප්‍රශ්න වලට තවමත් පිළිතුරු ලැබී නැත. ඒ වෙනුවට සිදුවී ඇත්තේ ඔහු නිහඬ කරනු පිණිස ඝාතනය කර, තවත් අයට තර්ජනය කරනු හෝ රටින් පලා යන්නට බල කරනු හෝ ලැබීමයි,”* යනුවෙන් සත්‍යය හා යුක්තිය පිළිබඳ ජාත්‍යන්තර ව්‍යාපෘතියේ (ITJP) විධායක අධ්‍යක්ෂිකා යැස්මින් සූකා පැවසුවාය.

*“මේ ආයුධ ගනුදෙනුව පිළිබඳව ගවේෂණය කිරීම නිසා මනුෂ්‍යයකු මරුමුවට පත් විය - ඔහුගේ මිනීමරුවන් යුක්තිය හමුවට ගෙන ඒම සහ ඩොලර් කෝටි ගණනක බදු ගෙවන්නන්ගේ මුදල් අතුරුදහන් වූයේ කොතැනටදැයි සොයා ගැනීමේ ණය අපි ඔහුට ගෙවිය යුතුය. සිය නම ශුද්ධ කරගන්නා තුරු උදයංග ආණ්ඩුවේ නිලයක් නොදැරිය යුතුය.”*

---

[1] http://www.dailynews.lk/2020/08/11/local/225546/ancl-staffers-mark-govt’s-landslide-victory-appointment-pm
Udayanga withdraws complaint to Presidential Commission, Sunday Times Lanka, 1 Nov 2020.

### *මිග් ගනුදෙනුව*

ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් 2006 දී යුක්රේන ආණ්ඩුව සතු ආයුධ සමාගමක් වන රාජ්‍ය ස්වයං ස්ථාපිත විදේශීය  වෙළෙඳ හා ආයෝජන සමාගම, යුක්රින්මාෂ්, වෙතින් මිග්-27 ප්‍රහාරක ගුවන් යානා මිලදී ගන්නා ලදී[2]. ශ්‍රී ලංකාව එක්සත් ජනපද ඩොලර් 9,848,000 කට මිග්-27 ගුවන් යානා හතරක් මිලදී ගත් අතර තමන් සතුව පැවති ගුවන් යානා සමූහය අලුත්වැඩියාව සඳහා යුක්රින්මාෂ් සමග එක්සත් ජනපද ඩොලර් 4,128,000 ක ගිවිසුමක් ඇති කර ගත්තේය[3].

### *යුක්රේන විමර්ශනය*

මිග් ගනුදෙනුවේදී එක්සත් ජනපද ඩොලර් 6,143,000 ක අයථා ගනුදෙනුවක් සිදුවී ඇති බව යුක්රේන නීතිපති ජනරාල් කාර්යාලයේ ප්‍රධාන හමුදා අභිචෝදකයා 2017 මාර්තුවේ දී කියා සිටියේය[4]. මුදල් යටි මඩි ගැසීමට යොදා ගැනුණු යාන්ත්‍රනය යුක්රේන අභිචෝදකයන් විසින් නඩු විභාගයට පෙර කියෙව් අගනුවර පෙචෙර්ස්කි දිස්ත්‍රික් අධිකරණයේ ගොනු කරන ලද පෙත්සම් හයක් මගින් විස්තර කරදී තිබුණි[5]. මිග් ගනුදෙනුවට සම්බන්ධ සමාන්තර ගිවිසුම් දෙකක් තිබුණු බව ඔවුන් විසින් සොයා ගන්නා ලදී. ඉන් එකක් “ව්‍යාජ” ය. ඒ දෙකම එකම ගුවන් යානා සම්බන්ධයෙනි. මේ ගිවිසුම් දෙක අතර මිල වෙනස අනුව යුක්රින්මාෂ් හට අහිමි වූ මුදල එක්සත් ජනපද ඩොලර් 6,143,000 කි. යුක්රේන විමර්ශනය විසින් උදයංග වීරතුංග සැකකරුවකු ලෙස හෝ වෙනත් ශ්‍රී ලාංකිකයකු හෝ නම් නොකොට වැඩි අවධානයක් යොමු කර තිබුනේ තමන්ගේම ජාතිකයන්ගේ සම්බන්ධය ගැනය[6].

### *ශ්‍රී ලාංකික විමර්ශනය*

මීට සමාන්තර පොලිස් පරීක්ෂණයක් ශ්‍රී ලංකාව විසින් යුක්රේන සහාය සහිතව 2015 මාර්තුවේදී ආරම්භ කරන ලදී. 2018 පෙබරවාරි 7 දා කොටුව උසාවිය විසින් උදයංග වීරතුංග අත් අඩංගුවට ගැනීම සඳහා වරෙන්තුවක් නිකුත් කිරීමේ අවසරය පොලිසියට දෙන ලදී. වරෙන්තුවේ සඳහන් පරිදි, වීරතුංග *“2006 පෙබරවාරි 6 සහ 2010 පෙබරවාරි 17 අතර කාලසීමාවේදී ශ්‍රී ලංකාවේ කොළඹ [...] සහ වෙනත් ස්ථානවලදී, වංචා කිරීම, සාපරාධී විශ්වාසය කඩකිරීම, වංචා කිරීමේ අදහසින් කූට ලේඛන සකස් කිරීම ස්ව කැමැත්තෙන් සිදු කළ අතර ඒ අනුසාරයෙන් ඔහු තවත් අය සමග එක්ව දණ්ඩ නීති සංග්‍රහයේ 400, 389 හා 457 යන වගන්ති යටතේ දඬුවම් කළ හැකි වැරදි, සහ මහජන දේපල පනතට එරෙහි වැරදි සහ මුදල් විශුද්ධිකරණය වැළක්වීමේ පනතේ 3 වැනි වගන්තිය යටතේ ගැනෙන මුදල් විශුද්ධිකරණයේ වරද සිදුකර”[7] ඇත.*

### *නිල සංචාර ඔස්සේ පලායාම*

ශ්‍රී ලංකා පොලිසියේ පස් අවුරුද්දක විමර්ශන කාලය තුලම විදේශගතව සිටි උදයංග වීරතුංග විමර්ශකයන්ගේ ප්‍රශ්න වලට පිළිතුරු දීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණීමෙන් වැලකී සිටියේය. මෑතදී ඔහු ජනමාධ්‍යයට කියා තිබුනේ පසුගිය ආණ්ඩුවට “ඒ කාලයේ මාව මෙහෙට ගෙන්න ගන්න බැරි උනා. මම ඒගොල්ලන්ට වැඩිය ශූරයි,”[8] යනුවෙනි.  ඔහුගේ වෙබ් අඩවිය අධ්‍යයනය කිරීමේදී පෙනී යන්නේ අත් අඩංගුවට ගැනීම සඳහා වරෙන්තුවක් ශ්‍රී ලංකාව විසින් නිකුත් කර තිබියදීත්, උදයංග සිය ඥාති සහෝදර මහින්ද රාජපක්ෂ සමග ජපානයේ සහ පකිස්තානයේ නිල සංචාර වල යෙදී සිටි ආකාරයක් දැකගත හැකි බවයි. විපක්ෂ මන්ත්‍රීවරයකු සහ හිටපු ජනාධිපතිවරයකු ලෙසින් මහින්ද රාජපක්ෂ සමග ගමන් කරන්නට ඇති රාජ්‍ය ආරක්ෂක නිලධාරීන් තම පිරිසේ පොලිසියට ඕනෑ කරන පුද්ගලයකු ඉන්නා බව දැන සිටියා විය යුතු නමුත් ඒ ගැන වාර්තා කළ බවක් පෙනෙන්නට නැත. මීට අමතරව, නීතිය පිළිපදින බවට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙසින් දී ඇති දිව්රුමෙන් බැඳී ඉන්නා මහින්ද රාජපක්ෂ තම ඥාති සහෝදරයා ඉන්නා තැන් වාර්තා කළ යුතුව තිබුණි. එමෙන්ම උදයංග සිය රටේ වරෙන්තුවක් යටතේ ඕනෑකර තිබූ අයකු බව ඒ ඒ රටවල ඉන්නා තානාපති නිලධාරීන් දැන සිටින්නට ඇත.

---

[2] Multimillion dollar MiG deal: Focus on fake contract but real story emerges now, 18 March 2018, Sunday Times (accessed via Factiva)
[3] The total value of the MiG deal, including a transportation charge of USD 700,000, was USD 14,676,000.
Multimillion dollar MiG deal: Focus on fake contract but real story emerges now, 18 March 2018, Sunday Times (accessed via Factiva)
**[4] In March 2017 the Investigative Department of the Chief Military Prosecutor of the Prosecutor General’s Office of Ukraine filed six petitions at the Pecherskyi District Court of Kiev requesting authorisation to access the phone and banking records and to conduct searches of UkrinMash’s offices. The court authorised the requests. (Ref: Case No. 757_13863_17-K; Case No. 757_16350_17-K; Case No. 757_16372_17-K; Case No. 757_16374_17-K; Case No. 757_16674_17-K; Case No. 757_20609_17-K).**
**[5] The most detailed account was made in a petition before the Pecherskyi District Court on 23 March 2017 (see Ref: Case No. 757_16674_17-K).**
**[6] A Ukrainian suspect was reportedly arrested in France on charges of money laundering though it’s not clear if this was in connection with the MIG deal.**
**[7] A copy of the warrant is available on the website of The Colombo Telegraph.**
[8] http://www.dailymirror.lk/breaking_news/We-have-to-be-thankful-for-Ukraine-for-sending-tourists-Udayanga-Weeratunga/108-203267

INTERNATIONAL TRUTH AND JUSTICE PROJECT

# UDAYANGA WEERATUNGA'S TRAVELS WHILE ABSCONDING



**28 FEBRUARY 2015:**
Udayanga's term as Ambassador to Moscow ends.

**6 MARCH 2015:**
His diplomatic passports are reportedly cancelled.





**10 MARCH 2015:**
Sri Lankan police start investigating the MIG deal.



**MAY 2015:**
Udayanga reportedly in Tehran.

**23 APRIL 2016:**
Udayanga photographed in Thailand with Mahinda Rajapaksa.

**11 MAY 2016:**
Udayanga photographed in Uganda with Mahinda Rajapaksa.



**3 JULY 2016:**
Udayanga photographed on family vacation in Germany & Italy.

**28 SEPTEMBER 2016:** meets ex-President of Ukraine Leonid Kuchma.

**20 OCTOBER 2016:** Sri Lankan court issues an open warrant for Udayanga and orders 16 bank accounts frozen.



**1 JUNE 2017:**
Udayanga photographed in Japan with Mahinda Rajapaksa.

**20 JUNE 2017:**
Udayanga photographed in Pakistan with Mahinda Rajapaksa.





**27 JUNE 2017:**
deputy Tourism Minister, Arundika Fernando, questioned by police about meeting Udayanga in Japan.

**30 JUNE 2017:**
Reports say court orders Udayanga's passports impounded.

**14 NOVEMBER 2017:**
Udayanga photographed at Dubai Air show.



**4 - 10 JANUARY 2018:**
Udayanga photographed in Nepal.

**4 FEBRUARY 2018:**
Media say Udayanga apprehended at Dubai airport.



**13 FEBRUARY 2018:**
Media says Dubai police summon Udayanga but he vanishes.

**25 MARCH 2018:**
Udayanga reportedly detained in UAE.

**3 AUGUST 2019:** Udayanga filmed at a pro-Gotabaya Rajapaksa election event in Dubai.



**14 FEBRUARY 2020:**
Udayanga returns to Sri Lanka and is arrested.

**3 APRIL 2020:**
Udayanga released on bail

**1 NOVEMBER 2020:**
Appointed as Co-ordinating Secretary in the Prime Minister's Secretariat.

අන්තිමේදී උදයංග 2020 පෙබරවාරි 13 දා පෙරලා සියරට බලා පැමිණි කල ඔහු අත් අඩංගුවට ගන්නා ලද මුත්, 2020 අප්‍රේල් 3 දා ඇප මත මුදා හරිනු ලදුව පසුව 2020 දී අගමැති මහින්ද රාජපක්ෂගේ කාර්යාලයේ නිල තනතුරකට පත් කරන ලදී. මෑතදී ඔහු කෝවිඩ් වසංගතය තිබියදී යුක්රේනයේ සිට ශ්‍රී ලංකාවට සංචාරකයන් ගෙන්නීමේ මතබේදාත්මක නියමු ව්‍යාපෘතියක කේන්ද්‍රීය පුද්ගලයා බවට පත්ව සිටී.
මිග් ගනුදෙනුවේ තවත් එක් සැකකරුවකු වන්නේ ශ්‍රී ලංකාවේ තුන්වැනි ජාත්‍යන්තර ගුවන් සේවය[9] පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ඉල්ලුම් කර ඇති එයාර් වයිස් මාර්ෂල් ජයනාත් කුමාරසිරි ය[10].

*"ලසන්ත වික්‍රමතුංග ඝාතනය සහ මිග් ගුවන්යානා මිලදී ගැනීම යන දෙකම සම්බන්ධ පරීක්ෂණ ඇණහිට ඇත. මාධ්‍යවේදියාගේ ඥාතීන් පමණක් නොව මුළු රටම පිළිතුරු බලා සිටී," යි යැස්මින් සූකා පැවසුවාය.*

*"සීමාකර ව්‍යවස්ථාවේ කල් ඉකුත් වන්නට පෙර මිග් නඩුව පෙරට ගෙන යාම තීරණාත්මක අවශ්‍යතාවකි."*

[9] http://www.smartaviation-apac.com/2020/09/fly-lankan-asia-to-operate-boeing-737-200s-and-bae-146s/

[10] Kumarasiri was given a distinguished service award in 2015 October by President Sirisena despite the fact that he was a suspect in the MiG investigation. http://www.asiantribune.com/node/88014

INTERNATIONAL
TRUTH
AND JUSTICE
PROJECT